**එරාවූර් නගර සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට එරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුද්දර ගාස්තු රු. 326,764 ක් ලැබිය යුතුව තිබුණද, ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 326,764 ගිණුම්වල හෙළිදරව් කළ යුතුවේ. | හිඟ රාජ්‍ය ආදායම් තුළ ලැබිය යුතු උසාවි දඩ මුදල් සහ අනෙකුත් ආදායම් ශේෂ පත්‍ර යේ (UC 18) හෙළිදරව් කර ඇති බව ඔබ වෙත දන්වා සිටිමි. |

### 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථා පහතින් දක්වා ඇත.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 | වර්ෂ කිහිපයක සිට ලබාදුන් අත්තිකාරම් රු.3,149,332ක් | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂ කිහිපයක සිට නිරවුල් නොකර පැවැති අත්තිකාරම් දැනට |

| | | | |
|---|---|---|---|
| | අයකිරීමට කටයුතු කර නොතිබුණි. | | හඳුනාගෙන කපාහැරීමට නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වසර දෙක ඉක්ම වූ තැන්පතු රු.15,023,038ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කඩිනමින් කටයුතු කළ යුතුවේ. | වර්ෂ කිහිපයක සිට හඳුනානොගත් තැන්පතු වර්තමානයේ එක් එක් ශීර්ෂයන් යටතේ වර්ගීකරණය කර ගෙවිය යුතු තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 4,101,063 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 2,673,521 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත, ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ විස්තර පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,145,500 | 17,758,436 | 6,152,549 | 11,605,886 | 3,708,000 | 15,111,703 | 4,583,686 | 10,528,016 |
| කුලී | 2,200,000 | 5,388,445 | 2,049,927 | 3,338,518 | 4,216,130 | 8,975,694 | 6,458,141 | 2,517,552 |
| බලපත්‍ර ගාස්තු | 6,975,000 | 8,673,055 | 5,686,800 | 2,986,255 | 1,650,000 | 3,515,240 | 1,805,650 | 1,709,590 |
| අනෙකුත් ආදායම් | 101,942,500 | 105,443,764 | 81,073,908 | 24,369,856 | 70,470,160 | 70,804,398 | 71,300,176 | 1,575,399 |
| **එකතුව** | 120,263,000 | 137,263,700 | 94,963,184 | 42,300,515 | 80,044,290 | 98,407,035 | 84,147,653 | 16,330,557 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟය රු. 17,097,544ක්වූ නමුත් වර්ෂය අවසානයේදී රු.23,288,690ක් ලෙස වර්ධනය වී තිබුණි. තවද පෙර වර්ෂවල තිබූ සියළුම හිඟ මුදල් සම්පූර්ණයෙන් අයකර ගෙන නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කර හිඟ මුදල් අයකළ යුතු වේ. | ඔබගේ විග්‍රහය අනුව ආදායම් රැස්කිරීමේ හිඟ මුදල් ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් වැඩි කොටසක් 2015 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල වේ. මේවාට අදාල කිසිදු ලේඛනයක් මෙහි නොමැති අතර මෙම වටිනාකම අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල හිඟහිටි ලෙස දැක්වේ. මෙය සෑම වර්ෂයකදීම ඇස්තමේන්තු වටිනාකමට අමතරව අයකළ අවස්ථාවේදි මෙම හිඟ මුදල අඩුකර ගත හැකිය. |

### 2.2.3 කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලංසු කුලී, මස් කඩ බදු, පැරණි වෙළඳපොල බදු රු. 4,975,606 ක් 2012 වර්ෂයේ සිට අයකර නොමැතිව හිඟහිටව පැවතුණි. | කාර්යාලයෙන් ලැබූ තොරතුරු පදනම් කරමින් වාර්තා සකස් කළ නමුත් ලේඛන නඩත්තු කිරීම ඉතාමත් සුදුසු වේ. | මෙම වටිනාකම් ඔබගේ විශ්ලේෂණ වාර්තාවේ හිඟ ප්‍රමාණයන් සමග සැසඳිමේදි වෙනස් අගයන් දක්නට ලැබේ. |
| (ආ) | විනෝද බදු රු. 179,630 ක් දීර්ඝ කාලයක් අයකර නොමැතිව හිඟහිටව පැවතුණි. | අයකර ගැනීමට කටයුතු යුතුවේ. | සිනමා ශාලා කළමනාකරු විදේශගතවී පිටරට පදිංචිවී සිටින බවට දැනගන්නට ලැබූ නිසා මෙම හිඟ මුදල් අයකරගත නොහැකි වී ඇති බව දන්වා සිටිමි. |

### 2.2.4 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.10,257,400 ක් උසාවි දඩ ගාස්තු සහ රු. 2,533,672 ක් මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මුද්දර ගාස්තු රු. 10,257,400 කින් රු. 2,967,550 ක් ආපසු ගෙවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට යවනු ලැබ ඇති අතර රු. 7,289,850 ක් පමණක් අප සභාවට ලැබිය යුතුව ඇත. තවද, උසාවි දඩ ගාස්තු ලෙස රු. 2,535,672 ක් 2020 මැයි මාසයේදී අප වෙත ලැබී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **තිරසාර සංවර්ධන අරමුණු**<br>2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්යයන් කඩිනම් කළ යුතු වේ. | තිරසර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් නිර්ණය කරනු ලබන දර්ශකයන් සකස් කිරීමට පියවර ගෙන ඇත. |
| (ආ) | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**<br>ඇතැම් අපද්‍රව්‍ය ගංඉවුරේ බැහැර කරනු ලබන අතර කාබනික පොහොර නිෂ්පාදනයක්ද සිදු නොවේ. | විධිමත්ව කසල බැහැර කිරීමට හා කාබනික පොහොර නිෂ්පාදනයට කටයුතු කළ යුතුවේ. | සම්පත් උපයෝගී කරගෙන ජනතාව දැනුවත් කර අපද්‍රව්‍ය වෙන්කර විධිමත්ව කළමණාකරනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. |
| (ඇ) | **පාරිසරික ගැටලු**<br>2017 වර්ෂයේ රු.මිලියන 32 ක ඇස්තමේන්තුවෙන් රු. 13,654,689 ක් වැයකර මධ්‍යම රජයේ සංචාරක කර්මාන්ත අමාත්‍යාංශයෙන් ළමා උද්‍යානයක් ඉදිකර තිබූ නමුත් මෙයට යාබදව කසළ බැහැර කිරීම නිසා වර්ෂ 02 කට අධික කාලයක සිට මෙම ළමා උද්‍යානය මහජනයාට භාවිතා කළ නොහැකි වී තිබුණි. | මහජන භාවිතයට යෙදවිය යුතුවේ. | අදාල උද්‍යානයේ සෙවන ලබාදෙන ගස් සිටුවා නඩත්තු කරනු ලබන අතර රටෙහි ඇතිවූ අසාමාන්‍ය වාතාවරණයෙන් පසුව මහජන භාවිතය සඳහා විවෘත කිරීමේ සැලැසුම් ක්‍රියාත්මක කර ඇති බව ඔබ වෙත දන්වා සිටිමි. |
| (ඈ) | **අතහැර දැමූ මෙහෙයුම්**<br>2001 වර්ෂයේ ආසන්න වශයෙන් රු. මිලියන 10 ක වියදමින් ඉදිකර අවසන් කළ කඩකාමර 64 කින් සමන්විත ප්‍රධාන මාර්ගයේ පිහිටි වෙළඳ ගොඩනැගිලි සංකීර්ණය මේ දක්වා මහජන භාවිතය සඳහා විවෘත කර කුලී ආදායම් කිසිවක් ලැබීමකින් තොරව වසා දමා තිබූ බව තිබුණි. | අධිකරණ තීන්දුව ලබා දුන් විගස පියවර ගත යුතු වේ. | 2009 දෙසැම්බර් 18 දින මඩකලපුව දිස්ත්‍රික් උසාවියේ (නඩු අංක L/5320) නඩු පවරා මේ දක්වා විභාග වෙමින් පවති. මේ නිසා උසාවි තීරණය ලැබෙන තුරු වෙළඳ පොල ජනතාවගේ භාවිතයට ලබාදිය නොහැකි හෙයින් ආදායම් ද අයකළ නොහැකිව පවති. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුන්නෙයිකුඩා මාර්ගයේ පිහිටි ආගමික ස්ථාන දෙකකට අයත් ඉඩම් වර්ෂ 33 ක දීර්ඝකාලීන බදු සඳහා ලබාගෙන රු.මිලියන 193 ක ඇස්තමේන්තුවකින් වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2016 ඔක්තෝබර් මස ගිවිසුම්වලට එළැඹ එම දිනයේ සිට රු.56,000 ක මාසික කුලියක් ගෙවා තිබුණි. වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම් කටයුතු නිම නොවී තිබූ බැවින් ඉඩම් කුලී 2016 ඔක්තෝබර් මාසයේ සිට කිසිඳු ආදායමක් උපයා ගැනීමකින් තොරව එම ආගමික ස්ථානවලට ගෙවමින් තිබුණි. | ඉතා ඉක්මණින් විවෘත කර ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතු වේ. | ගිවිසුම් කොන්දේසි අනුව ආගමික ස්ථාන දෙකට මාසිකව රු. 56,000 ක් ලබාදෙනු ලැබේ. අදාල වෙළෙඳ පොල දුම්රිය ස්ථාන ඉඩමෙහි තාවකාලිකව ක්‍රියාත්මක වේ. එයට අනුව දෛනිකව එම වෙළෙඳ පොලෙන් ලැබෙන ආදායම් මගින් කුලි ගෙවනු ලැබේ. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන් | | |
| තෘතීය මට්ටමේ නිළධාරීන් 03 ක පුරප්පාඩු සහ ප්‍රාථමික මට්ටමේ 20 ක අතිරික්තයක් විය. | අතිරික්ත නිලධාරීන් මාරු කර යැවීමටද පුරප්පාඩු පිරවීමටද කටයුතු කල යුතුයි. | 2015, 2016, 2017 වර්ෂවල කොන්ත්‍රාත්/වැඩබැලීමේ පදනමින් වූ සේවකයන් අත්‍යාවශ්‍ය හේතුවෙන් බඳවාගෙන සභාවේ අරමුදල් තත්ත්වයට අනුව දිනකට රු.391 ක වැටුපකට රාජකාරි කරති. ඔවුන් නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ලේකම්ගේ අනුමැතිය සහිතව තාවකාලික පදනමින් වූ සේවකයන් ලෙස බඳවාගෙන තිබුණි. ඉන් සේවකයන් 40 දෙනෙකු දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හේතුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014, 24/2014(1)ට අනුව ස්ථිර සේවකයන් ලෙස (Personal to Holder) බඳවා ගෙන තිබුණි. මෙම හේතුව නිසාම ප්‍රාථමික මට්ටමේ සේවකයන්ගේ තථ්‍ය සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවට වඩා වැඩියෙන් දැක්වුණි. දැනට සිදුවන සේවක බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුව අපට අවශ්‍ය සේවකයන් ලබාගැනීමට අනුමැතිය ඉල්ලා සිටීම මගින් මෙම ගැටළු නිරාකරණය විය හැකි බව අපේක්ෂා කෙරේ. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සියළුම ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ඒවා සළකුණු කර ලේඛන ගත කිරීමට සුදුසු ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය දක්වා ගෙන නොතිබුණි. | සියළුම වත්කම් ඇතුළත් විය යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛන සකස් කර නඩත්තු කරනු ලබන බව දන්වා සිටිමි. |

3.4.2 නඩත්තුව සහ අළුත්වැඩියා කිරිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ට්‍රැක්ටර් 04 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට අළුත්වැඩියා නොකර පැවතුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේදී අලුත්වැඩියා කරනු ලැබේ. |

3.4.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ පවතින වාහන 09 ක් සඳහා වාහන ලියාපදිංචි කිරීමේ සහතික පොත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පනතේ විධිවිධාන ප්‍රකාරව, ලබාගෙන නොතිබුණි. Pickup, Tractor, Roller, 02 water bowser දීර්ඝ කාලයක සිට අළුත්වැඩියා නොකර පැවතුණි. තවද කුඩා ප්‍රමාණයේ Tractor 03ක් වර්ෂ කිහිපයක සිට පොත්වලින් ඉවත් කර තිබූ බව දක්නට ලැබේ. | සභාවේ පවතින සියලු වාහන සඳහා වාහන ලියාපදිංචි කිරීම් සහතික ලබා ගැනීමට කටයුතු කල යුතුයි. | මේ නිසා අදාල වාහන වෙන්දේසියේ විකිණීම සඳහා නිර්දේශ කර විකිණීමට කටයුතු සිදු කරමින් පවති. |

## 3.4.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කරුමාරියම්මන් කෝවිල් මාර්ගයේ කානු ඉදිකිරීම් කර්මාන්තය සඳහා 2015 වර්ෂයේ සිට අදියර 05 ක් යටතේ රු. 8,324,190 ක් ඇස්තමේන්තු කර රු. 9,048,855 ක් වැයකර තිබූ නමුත් කාර්යයන් මෙතෙක් සම්පූර්ණයෙන් අවසන් කර නොතිබුණි. | ඉදිරියේදි මෙවැනි ගැටළු නොවන ආකාරයට පරීක්ෂාකාරී විය යුතුවේ. | අඛණ්ඩ කාර්යයක් ලෙස අදාල කාර්යයන් නියමිත වර්ෂයේ සිදු කර අවසන් වූ හෙයින් ඇස්තමේන්තු වටිනාකමට වඩා වැය වූ ප්‍රමාණය වැඩියෙන් දැක්වුණි. |
| (ආ) **අධිකාරි බලය නොලත් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම** | | |
| යූඩීඒ, ආර්ඩීඒ සහ පරිසර අධිකාරිය ආදියෙන් පූර්ව අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල අනුමත නොවූ ගොඩනැගිල්ලක් ලෙසට සලකා තිබුණි. | අදාල ආයතනවලින් නීතිමය අවසරය ලබා ගැනීමට කඩිනම් පියවර ගතයුතු වේ. | RDA සහ මධ්‍යම පරිසර අධිකාරියෙහි අනුමැතිය ලබාගැනීම සඳහා කටයුතු කරමින් පවති. |
| (ඇ) **පුස්තකාල ගොඩනැගිලි සංකීර්ණය සමගින් වූ සංස්කෘතික මණ්ඩපය** | | |
| (i) කොන්ත්‍රාත්කරු විසින් සත්‍ය වශයෙන්ම ඝන මීටර 400.42ක පස් සපයා පුරවන ලද නමුත් සභාව විසින් ඝන මීටර 988.80ක පස් පිරවූ ලෙස සලකා කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදු කර තිබුණි. මේ හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු.1,176,760 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ පිළිබඳ වාර්තාව ලබාගැනීම සඳහා තාක්ෂණික නිපුණතා දැනුමක් හා අත්දැකීම් සහිත කමිටුවක් පත්කර ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ii) කොන්ත්‍රාත්කරු ඝන මීටර 66.04 ඝනකම මතුපිට කාර්යයන් සිදුකර තිබුණත්, ගෙවීම් ඝන මීටර 93.75ක ඝනකම මතුපිටක් සඳහා ගෙවීම් සිදුකර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රු.387,980 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | වාර්තා ලබාගැනීමට කඩිනම් කළ යුතු අතර පිටපතක් විගණනයටද ඉදිරිපත් කළ යුතුවේ. | මේ පිළිබඳ වාර්තාව ලබාගැනීම සඳහා තාක්ෂණික නිපුණතා දැනුමක් හා අත්දැකීම් සහිත කමිටුවක් පත්කර ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | |
|---|---|---|
| (iii) ආර්ඩීඒ, යූඩීඒ සහ පරිසර අධිකාරිය ආදියෙන් පූර්ව අනුමැතිය ලබා නොගෙන මෙම ඉදිකිරීම සිදුකර තිබුණි. | අනුමැතිය ලබාගත යුතුවේ. | අනුමැතිය ලබාගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | මෙම ඒකකයේ කටයුතු කඩිනම් කළ යුතුවේ. | ඉදිරි කාලවලදී, අභ්‍යන්තර විගණකයෙකු ප්‍රධානත්වයෙන් මෙම ඒකකය ස්ථාපිත කර එහි කටයුතු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්වූ බව සඳහන් කරමි. |